# නාට්‍ය යනු කුමක්ද?

Drama යනුවෙන් ඉංග්‍රීසියෙන් හැඳින්වෙන වචනය "Dromenon" හෝ Dran (To do) යන ලතින් වචනයෙන් බිහි වූවකි. එහි අර්ථය වන්නේ අභිනය මගින් කිසියම් ක්‍රියාවක් හෝ ස්වභාවයක් හෝ නිරූපණය කර පෙන්වීම යි. චතුර්විධ අභිනය භාවිතයෙන් කිසියම් අවස්ථාවක් හෝ
සිද්ධියක් හෝ නිරූපණය කිරීම නාට්‍යය නම් වේ නාට්‍ය කලාවේ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයක් වනුයේ නාට්‍ය පෙළක් හෙවත් පිටපතක් භාවිත කිරීම ය.

## නාට්‍ය කලාව පිළිබඳ විද්වතුන්ගේ අදහස

"ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම නාට්‍යය යි." - භරතමුණි
"නාට්‍ය වූ කලී කිසියම් කාර්යයක් අනුකරණය කිරීම." ය. - ඇරිස්ටෝටල්
"නාට්‍යය යනු ජීවිතෙන් පෙත්තකි." - බර්නාඩ් ෂෝ
"නාට්‍යකරුවා ජීවිතයට කැඩපතක් අල්ලයි." - ශේක්ස්පියර්

## කතාන්දරයක් යනු

කතාන්දරයක් යනු කියවා සහ අසා රස විඳීමට තිබෙන සිද්ධි මාලාවක්සහිත, ඇතැම් විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි. නාට්‍යයක්යනු විශේෂයෙන් තෝරා ගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කර ගත් සංවාද ඇතුළත්, ප්‍රබල පෙළක් සහිත ව නරඹා රස විඳීමට තිබෙන්නකි.නාට්‍යයක ඇතුළත් සිද්ධි මාලාව අනුපිළිවෙළින් ගොඩ නැංවීම අනවශ්‍ය ය.නාට්‍යයක කතා වස්තුවේ විකාශය කෙටි කාලීන විය යුතු වේ. නාට්‍යයක්යනු මතුපිටින් පෙනෙන අර්ථයට වඩා ව්‍යංගයෙන් ඇඟවෙන යටි පෙළක්සහිත ව ප්‍රේක්ෂකයාට රසයක් සහ ජීවිතාවබෝධයක් ලබා දෙන්නකි

**හීල්බත් දංකුඩ**
එක ගමරාළ කෙනකුට හීල්බත් දංකුඩවලට පුදුම කෑදරකමක් තිබුණා. උදේ නැගිට්ට පැදුරෙන්
කුස්සියේ වළංදරට රිංගන්නේ දංකුඩ ටිකක් සූරගෙන කන්න බලාගෙනයි.
ගමයගෙ කරුමෙට වගේ ගම මහගෙත් දංකුඩවලට ඊටත් වැඩිය ආසයි. ඉතින් මේ ගෙදර හැමදාම
උදේට දංකුඩවලට හබේ. දවස පටන් ගන්නෙ ම රංඩුවෙන්.මෙහෙම ඉන්න කොට එක දවසක් රටේ රජ්ජුරුවන්ගේ අණ බෙර කාරයකු මේ ගමට ආවා.මහගෙ අණ බෙර කාරයා කියන දේ හොඳට අහගෙන හිටියා.ඒ රටේ රජ්ජුරුවන්ගෙ එක ම දූ කුමරියගෙ නාහෙ මල් ඇටයක් හිර වෙලා. මොන විදියකින් වත්එළියට ගන්න බැරුව දූත් දූත් නාහෙත් වණ වෙලා. කුමාරිගෙ නාහෙන් මල් ඇටේ අරගෙන දාපුකෙනෙකුට ඇතෙක් බරට වස්තුව දෙනවා. හැබැයි බැරි වුණොත් ඉස ගසා දානවා.
''අපේ ගමරාළට ඕක කරන්න පුළුවන්'' කියලා මහගෙ අණ බෙරේ නැවැත්තුවේ හීල්බත් දංකුඩ
තනියම කන්නට හිතාගෙනයි. රජ අණ හින්දා කරන්න දෙයක් නෑ. ගමයා මර බියෙන් රජ වාසලට යන්න පිටත් වුණා. අතරමගදී ''චූස්'' ගාලා ඇටිකිත්තෙක් පැගුණා. ඒක අසුබ නිමිත්තක් කියල හිතාගෙන යනකොට ''චරස්'' ගාලා
කකුළුවෙක් පැගුණා. ඒක තවත් බාධාවක් කියල හොඳට ම හිත නරක් වෙලා තව ටික දුරක් යනකොට
හාවෙක් පාර ඉස්සරහ එහා මෙහා හැරිල ආයෙත් කැලේට ම දිව්වා. දූන්නම් මැරෙන එක සිකුරු යි
කියල සහසුද්දෙට ම දන්නවා.රජවාසල දී රජ්ජුරුවන්ට තියෙන බය හින්දම ''මට මල් ඇටේ අරගෙන දාන්න
පුළුවන්. ඒත්ඒකට පොඩි බලියක් අරින්න ඕන.'' කිව්වා.
කළමනා ලෑස්ති කරලා දීලා රජ්ජුරුවොයි, බිසවයි, කුමාරිකාවයි අනික් අය එක්ක බලි බලන්න
වාඩි වුණා.ගමරාළ උඩැක්කිය ගහන ගමන් වෙන බලි යාග දන්නෙ නැති හින්ද කවියක් වගේ මෙහෙම
කිව්වා.
''ඇටිකිති චුස්
කකුළු චරස්
හාවා කළ එකෙල මෙකෙල
මේ මරණින් බේරුණොතින්
තවත් නොකම් හීල් බත් දංකුඩ''
මේක ඇහුණ ගමන් රාජකුමාරි ඉවසිල්ලක් නැතුව කට වහ ගෙන හිනාවෙන්න පටන් ගත්තා. ඒ
එක්ක ම නාහෙ හිරවෙලා තිබුණ මල් ඇටෙත් එළියට විසි වුණා.
(උපුටා ගැනීම - ශ්‍රී ලංකාවේ ජනකතා එකතුව - එස්. විජේසූරිය)

**කතාන්දරයකින් නාට්‍යයක් වෙනස් වන්නේ කෙසේ ද?**

කතාවක් කියන්නා සිදුවූ දේ විස්තර කරයි. නැතහොත් ලියා තිබෙන කතාවක් කියවන්නා සිදුවූයේ කුමක්දැයි දැන ගනී. කතා කරුවාට යම් අරමුණක් තිබිය හැකිය. කතාව රස විඳින්නා තුළ චමත්කාරය ඇති කිරීමේ හාස්කමක් සාහිත්‍ය කතා කලාවට ද ඇත. **කතාන්දරයක් යනු කියවා සහ අසා රස විඳීමට තිබෙන සිද්ධි මාලාවක් සහිත, ඇතැම් විට සංවාද ඇතුළත් දීර්ඝ කතා පුවතක් සහිත වූවකි.**

නාට්‍යයක් යනු විශේෂයෙන් තෝරා ගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කර ගත් සංවාද ඇතුළත්, ප්‍රබල පෙළක් සහිත ව නරඹා රස විඳීමට තිබෙන්නකි. දෘශ්‍ය කලාවක් ලෙස නාට්‍ය හඳුන්වන්නේ එබැවිනි.

නාට්‍යයක ඇතුළත් සිද්ධි මාලාව අනුපිළිවෙළින් ගොඩ නැංවීම අනවශ්‍ය ය. නාට්‍යයක කතා වස්තුවේ විකාශය කෙටි කාලීන විය යුතු වේ. නාට්‍යයක් යනු මතුපිටින් පෙනෙන අර්ථයට වඩා ව්‍යංග්‍යයෙන් ඇඟවෙන යටි පෙළක් සහිත ව ප්‍රේක්ෂකයාට රසයක් සහ ජීවිතාවබෝධයක් ලබා දෙන්නක

| **කතාන්දරය** | **වේදිකා නාට්‍යය** |
| --- | --- |
| කියවා හෝ අසා රස විඳිය හැක. | රඟදැක්වීමට, බලා රස විඳීමට තිබෙන්නකි. |
| සිද්ධි මාලාවක් ඇත | සිද්ධි මාලාවක් ඇත. |
| මුල, මැද, අග සහිත සිද්ධි මාලාවක් ඇත | සිද්ධි මාලාව අනු පිළිවෙලින් තිබීම අවශ්‍ය නැත. |
| සංවාද ඇත | සංවාද ඇත, ඒවා ඉතා ප්‍රබල විය යුතු ය. |
| කතා වස්තුවේ විකාශනය දීර්ඝ විය හැකිය | විශේෂයෙන් තෝරාගත් කතා වස්තුවක් විය යුතුය. |
| ගැටුම් අවස්ථා ඇත. | ගැටුම් අවස්ථා ඇත. |
| එක් පුද්ගලයෙකුගේ නිර්මාණයක් විය හැකිය. | සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. |
| කතා පිටපතක් ඇත. | රංග විධාන සහිත රඟදැක්වීමට සුදුසු පිටපතකි. |
| ශ්‍රාවකයා හෝ පාඨකයා විසින් රස විඳි යි | ප්‍රේක්ෂකයා විසින් රස විඳි යි. |









